**කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

**පොල් වගාකිරීමේ මණ්ඩලය**

**තනතුරු පුරප්පාඩු - 2024**

**<u>පොල් වගාකිරීමේ මණ්ඩලයේ වතු පාලන සේවාවේ පහත සඳහන්</u>**

**<u>තනතුරු පුරප්පාඩු සඳහා</u>**

**<u>ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.</u>**

**තනතුර: වතු රියදුරු III ශ්‍රේණිය PL 3**

**සේවා ස්ථානය :- සේවා අවශ්‍යතාවය මත දිවයිනපුරා - තනතුරු 04**

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

බාහිර සුදුසුකම් - "රියදුරු" තනතුර

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් වත් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

සහ

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලබන වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක් (ඉඩම් වාහන ඇතුළුව) ලබා තිබීම, (බඳවා ගන්නා දිනට වසර තුනකට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතුය.) අදාළ වාහන කාණ්ඩයේ රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.) අවම උස අඩි 05අඟල් 2 ½ වීම, දිවා කාලයේ හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතුය. මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

අභ්‍යන්තර සුදුසුකම් - "රියදුරු" තනතුර

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන වලංගු බර වාහන රියදුරු බලපත්‍රයක්/ අදාළ වාහන කාණ්ඩයට අයත් වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම හා බලපත්‍රය ලබාගැනීමෙන් පසු රියදුරෙකු වශයෙන් වසර 03ක සේවා පළපුරුද්දක් සහිත මණ්ඩලයේ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) හෝ අර්ධ ශිල්පීය (PL 2) සේවා ගණයක වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

**වැටුප් කාණ්ඩය** : PL - 3
**වැටුප් පරිමාණය** : රු. 26,290 - 270x10 - 300x10 – 330x10 – 350x12 - 39,490
**දීමනා** : ජීවන වියදම් දීමනාව රු. 17,800 ඇතුළු රජයේ අනෙකුත් දීමනා
**වයස** : අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ.

**වෙනත් කොන්දේසි :**

I. සෑම ඉල්ලුම්කරුවෙක් ම, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- **ඒ අනුව 2024/07/08 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමුකළ යුතුවේ.** එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සමඟ අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සියලුම අයදුම්පත් 2024.07.24 දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සළකා කටයුතු කරනු ලැබේ.

**අදාළ අයදුම්පත් පහත වෙබ් අඩවියෙන් බාගත කරගන්නා ලෙස දන්වමි.**

**http://coconutsrilanka.lk**